# මාතෘකාව හැඳින්වීම

ජනමාධ්‍යවේදයට මිනිසුන් දැනුවත් කළ හැකිය. එසේම ඊට බාධා ද කළ හැකිය. ජනමාධ්‍යවේදය තුළ තොරතුරු විකෘති කිරීම, ආරක්ෂාව විවේචනය, පාලනයට සේවය කිරීම, ව්‍යාපාරවලට සේවය කිරීම, ආණ්ඩුවට බලයේ සිටීමට හෝ විරුද්ධ පක්ෂයට බලයට ඒමට සේවය කිරීම, මංමුළා කිරීම, ඇන්දවීම, සමාජ ජීවිතය පිළිබිඹු කිරීම, යථාර්ථය විකෘති කිරීම, සමාජ සාමයට සේවය කිරීම, යුද්ධයට සේවය කිරීම, කෙටියෙන් පවසතොත් ජනමාධ්‍යවේදය යනු සමාජීය ජීවිතයේ සියලුම ක්ෂේත්‍රවල සම්පිණ්ඩිතාකාරයේ මහෝ මූලික සාධකයයි. ජනමාධ්‍යය යනු දස ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ විඥානය, මනස, සංවේදීතාව, බුද්ධිය, හැඟීම්, රසාස්වාදනය, පරිකල්පනය පමණක් නොව චර්යාවන් , හැසිරීම් රටාවන් හැඩගැස්වීමේ ප්‍රබල මෙවලමක් වන අතර එය මිනිසුන් ඒ අරමුණ හෝ ප්‍රවනතාව ඔස්සේ මෙහෙයවීමට තීරණාත්මක බලපෑමක් කිරීමට සමත් සුවිශේෂ බලයකි. මේ අනුව ජනමාධ්‍යසමාජයීය ආයතනයක් වශයෙන් සමාජයීය ජීවිතය සංවිධානය කර ගැනීමට, සකස් කර ගැනීමට, ගොඩනගා ගැනීමට ප්‍රබල බලපෑමක් කළ හැකි ශක්‍යතාවයකින් සමන්විත බව කිව යුතුය. නමුත් අද්‍යතන ලෝකයේ අපේ සමාජයේ මානව සාමය පිළිබඳ දැඩි අවශ්‍යතාවයක් පවතී. නමුත් වර්තමාන ලෝකයේ ජීවත් වන බහුතර ජනතාවකගේ ජීවිතය යුද්ධය නොවේ නම් සාමකාමී නොවන තත්ත්වයක පවතියි. එහෙත් මෙම තත්ත්වය වෙනස් කිරීමට ජනමාධ්‍යවේදය වගකීමෙන් යුතුව ක්‍රියාකොට නැතුවා පමණක් නොව පවතින තත්ත්වය තවත් අයහපත් ලෙස වර්ධනය වීමට ජනමාධ්‍යවේදය ක්‍රියා කොට තිබේ. යුද මාධ්‍යවේදය ගොඩ නැගෙන්නේ එකී පසුබිම තුළය.

එසේම සෑම ජනමාධ්‍යයක්ම කිසියම් පාර්ශවීක බල දේශපාලනයක්, වාණිජ බල ව්‍යාපෘතියක් සමග ගැට ගැසී තිබීමත් ඊට අනුගතව මාධ්‍ය භාවිතයන් සිදු වීමත් වැළැක්විය හැකි නොවේ. එහෙත් විවිධ දේශපාලන හා වාණිජ අරමුණු මත ක්‍රියාත්මක වුවද එය අවසාන විග්‍රහයේ දී රාජ්‍යයේ පැවැත්ම, ජාතික ආරක්ෂාව සම්බන්ධව ගත් විට ජාතික වගකීමකින් යුක්තව කටයුතු කළ යුතු බව ද විවා ද රහිතය. සියල්ලටම ඉහළින් පැවතිය යුත්තේ රටය. කිසියම් මාධ්‍ය භාවිතයක් මාධ්‍ය සන්දර්භය තුළ මාධ්‍ය නිදහස ලෙස සාධාරණීකරණය කළ හැකි වෙතත් එම මාධ්‍ය භාවිතය රාජ්‍යයේ පැවැත්මට බලපාන ආකාරයට සාපේක්ෂව බලන විට එබඳු මාධ්‍ය භාවිතයක එබඳු මාධ්‍ය නිදහසක ඇති ගැටලු සහගත බව හඳුනා ගත හැකිය.

ශ්‍රී ලංකාව පිළිබඳව විමසීමේදී ද යුද වාර්තාකරණය තුළ ඉහත දැක් වූ සංකීර්ණ, ගැටලුකාරී ස්වභාවය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව වැනි බහුවාර්ගික රටක එදිනෙදා ප්‍රශ්න පිළිබඳව පවා තමන්ගේ වාර්තා හේතු කොට ගෙන ගැටුම්කාරී තත්ත්වය වැඩි කිරීමට හෝ අඩු කිරීමට ඇති හැකියාව ජනමාධ්‍යවේදීන් වටහා ගත යුතුය. විශේෂයෙන්ම යුදමය අවස්ථාවක ප්‍රජාවන්ට නිරවද්‍ය, සත්‍යවාදී, අවංක, ස්වාධීන සහ අපක්ෂපාති තොරතුරු අවශ්‍යවන අතර එහිලා වඩා වැදගත් කාරණය වනුයේ එකී කාර්ය ආචාරධර්මිකව ඉටු කිරීමයි. එනම් යුද තොරතුරු වාර්තාකරණයෙහි ලා මාධ්‍යවේදීන් ආචාරධර්මීය පදනමක සිට ක්‍රියාත්මක විය යුතු බවයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ යුද වාර්තාකරණ ක්‍රියාවලියේ නියුතු ජනමාධ්‍යවේදීන්ගේ ආචාරධර්ම සම්බන්ධ සවිඥානිකත්වය කෙබඳුද? එහිලා බලපෑවැත්වෙන ශක්‍යතා හා සීමා මොනවාද යන්නත් හඳුනා ගැනීමට ඇති වූ අවශ්‍යතාව මෙම ප්‍රථම උපාධි නිබන්ධනය බිහිවීමට පසුබිම් විය.